# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2022 නොවැම්බර් මස 04 වන දින

## II වන කොටස

## අතිරේකය

(2022.11.10 දින නිකුත් කරන ලදී)


# නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ (සංශෝධන)

**1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිල : රු. 15.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් 1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනතේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, අමාත්‍යවරයා විසින්, අදාළ සේවා සපයන්නන් විසින් පනවනු ලබන ගාස්තුවක් හෝ බද්දක් පැනවීම සහ අය කිරීම නියාමනය කිරීම සම්බන්ධයෙන් නියෝග සෑදීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

## නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ (සංශෝධන)

එල්.ඩී.—ඕ. 21/2022

**1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

*ලුහුඬු නාමය*

**1.** මේ පනත 2022 අංක      දරන නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*1972 අංක 10 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම*

**2.** 1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනතේ 3 වන වගන්තියේ (5) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (ඉ) ඡේදයේ "ක්‍රියා හෝ නොකර හැරීම් තහනම් කිරීම" යන වචන වෙනුවට "ක්‍රියා හෝ නොකර හැරීම් තහනම් කිරීම; සහ" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම උපවගන්තියේ (ඉ) ඡේදයේ අවසානයට, පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(ඊ) තමන් විසින් සපයනු ලබන සේවා සඳහා, නැව් නියෝජිතයන්, නැව් බඩු ගෙනයන්නන්, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන් සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ගේ අදාළ සේවා සපයන්නන් විසින් පනවනු ලබන ගාස්තුවක් හෝ බද්දක් සහ එවැනි ගාස්තුවක්, හෝ බද්දක් පැනවීමේ සහ එකතු කිරීමේ කාර්ය පටිපාටිය නියාමනය කිරීම.".

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව